# මානාවෙල ඇල්ල සංචාරක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම

**ඒ.එම්.යූ.එම්. අබේකෝන්**[1]

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කරන ප්‍රධාන කර්මාන්තයක් ලෙස සංචාරක කර්මාන්තය ආර්ථික ක්ෂේත්‍රයේ ඉහළින්ම දක්නට ලැබේ. ඒ සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස ස්ථානීය සංචාරක ප්‍රවර්ධනය වැදගත් වේ. එය ග්‍රාමීය හෝ නාගරික විය හැකිය. එනමුත් වර්තමානය වන විට ද, ග්‍රාමීය මට්ටමේ ආකර්ශනීය ස්ථාන තුළ, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය වීම ඉතා මන්දගාමී මට්ටමක පැවතීම විශාල දුර්වලතාවයකි. එවැනි එක් ආකර්ශනීය ස්ථානයක් ලෙස ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ නගරයේ ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මානාවෙල ඇල්ල තවමත් සංචාරක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය වී නොමැති ආකාරය හඳුනාගත හැකිය. රාමා සීතා කතා පුවතට මෙන්ම මානාභරණ රජුගේ ඉතිහාසයට නෑකම් කියනු ලබන මානාවෙල ඇල්ල ස්වාභාවික උරුම සංචරණය ප්‍රවර්ධනය කළ හැකි පෞරාණික ස්ථානයකි. දිය ඇල්ල අසල දක්නට ලැබෙන භූ රූප විද්‍යාත්මක වශයෙන් වැදගත් වන ශෛලමය ඇළ මාර්ග, ශෛලමය බේසම් ආකාරයේ නාන ස්ථාන, ශෛලමය කෙවෙනි, ආසන, දම්වැල්, ඔටුන්න  මෙන්ම ඇල්ල ආශ්‍රිතව පිහිටි කෝවිල හා ස්ත්‍රීපුර කඳුවැටිය මෙම ස්ථානය පහසුවෙන් සංචාරක ආකර්ශනීය ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කළ හැකි බව විදහා දක්වනු ලැබේ. නමුත් වර්තමානය වන විට මානාවෙල ඇල්ල සංචාරක ස්ථානයකට වඩා බේබද්දන්ගේ හා නිධන් සොරුන්ගේ පාරාදීසයක් බවට පත්වෙමින් පවතී. එසේ සිදු වන්නේ ඒ සඳහා ආයතනික, දේශපාලනික හෝ රාජ්‍ය මැදිහත් වීම අවම මට්ටමක පැවතීමයි. ඒ අනුව මානාවෙල ඇල්ල සංචාරක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට නම් රාජ්‍ය මැදිහත් වීම, ප්‍රචාරණය, සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, යටිතල පහසුකම් දියුණු කිරීම, ප්‍රදේශවාසීන්ගේ දැනුවත්භාවය ආදී බොහෝ අංශ ප්‍රවර්ධනය කළ යුතුය. මේ ආකාරයෙන් මානාවෙල ඇල්ල සංචාරක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කළ හැකි අතර, එමඟින් ග්‍රාමීය ආර්ථිකය ද ශක්තිමත් කළ හැකිය. ඒ අනුව මානාවෙල ඇල්ල ආකර්ශනීය සංචාරක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. අධ්‍යයන ගැටළුව වන්නේ, ආකර්ශනීය වූත්, පෞරාණික වූත් මානාවෙල ඇල්ල සංචාරක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කළ හැකිද? යන්නයි. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය යොදා ගන්නා ලදි. ඒ අනුව මානාවෙල ඇල්ල දෙස්-විදෙස් ජනයාගේ ආකර්ශනය දිනාගන්නා සංචාරක ස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කළ හැකි වන්නේ නම් ශ්‍රී ලාංකීය ආර්ථිකය ශක්තිමත් කරගැනීමට එය මහඟු රුකුලක් වන බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** මානාවෙල ඇල්ල, ප්‍රවර්ධනය, ආර්ථිකය, සංචාරක කර්මාන්තය, පෞරාණික

[1] රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. udayanganiabeykoon2@gmail.com